# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
# அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
# Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: (94) 011- 2694560 Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk Web Site


---

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/03/01
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2021.12.13

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කරන ලද සංවර්ධන නිලධාරීන් සඳහා වැටුප් වර්ධක ගෙවීම</u>**

සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් යොමුකරන ලද මගේ අංක CS/DOS/05/03/01 හා 2017.12.14 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ අවධානය යොමුකරමි.

02. මේ වනතෙක් 2015.05.09, 2016.12.22, 2018.06.30 සහ 2019.11.30 යන දිනයන්හි සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ (සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 10වන ඡේදයේ විස්තර කර ඇති 1වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ) 4ක් පවත්වා ඇති අතර ප්‍රතිඵලද නිකුත් කර ඇත. එසේ නමුදු ඉහත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලදී පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කල නිලධාරීන් අතුරින් සැලකිය යුතු නිලධාරීන් පිරිසකගේ සේවය ස්ථිර කිරීම සඳහා වූ අදාල ලේඛන ඒකාබද්ධ සේවා අංශය වෙත තවමත් යොමු වී නොමැති බව නිරීක්ෂණය කරමි. එසේම තවත් නිලධාරීන් විශාල ප්‍රමාණයකගේ සේවය ස්ථිර කිරීම සඳහා යොමුකල ලේඛනවල පවතින අඩුපාඩු අමාත්‍යාංශ වෙබ් අඩවියේ දක්වා ඇත.

03. "කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්බන්ධයෙන් සහන ලබාදීම" මැයෙන් වූ 2016.05.24 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2016 හි දක්වා කරුණු අනුව 2013 වර්ෂයේ සිට සංවර්ධන නිලධාරී සේවයට බඳවා ගනු ලැබූ නිලධාරීන් පත්වීම් දින සිට වසර 3ක් තුළ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු අතර වසරකට දෙවරක් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්විය යුතුය යන පදනම මත අනුගාමී විභාග වාර 6ක් ඇතුළත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීමට නිලධාරීන්හට අවස්ථාව සලසා ඇත.

04. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 03/2016 4 ඡේදයේ අනු අංක 4 යටතේ දක්වා ඇති බලතල අනුව පහත අවශ්‍යතා සම්පූර්ණ කර ඇති සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ට උපයාගෙන ඇති වැටුප් වර්ධක ගෙවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

- අදාල විශ්ව විද්‍යාලය මඟින් උපාධිය සනාථ කරගෙන තිබීම.
- කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල නියමිත ආකෘතිය මඟින් අදාළ නිලධාරියා වෙත දන්වා තිබීම.

- නිලධාරියාගේ පරිවාස වාර්ථා, කාර්ය සාධන වාර්ථා නිසි පරිදි සම්පූර්ණ කර ඇගයුම්කරු හා ප්‍රමාණකරු නිසි පරිදි ප්‍රමාණනය කර තිබීම.
- වාර්ෂික වැටුප් වර්ධකයක් ගෙවීමට අදාළ අනෙකුත් සියළුම අවශ්‍යතා නියමිත පරිදි සපුරා තිබීම හා
- සේවයේ ස්ථිර කිරීමට අවශ්‍ය සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබීම.

05. එලෙස වැටුප් වර්ධක ගෙවනු ලබන සංවර්ධන නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීම සඳහා අදාල ලේඛන අඩුපාඩු සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සමඟ නොපමාව මා වෙත යොමු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්